ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2016 මාර්තු මස 04 වැනි දින |

## 2015 දෙසැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

වෙළඳ හිඟය පුළුල් වීම, සංචාරක ඉපැයීම්හි අඛණ්ඩ ඉහළ වර්ධනය සහ මධ්‍යස්ථ මට්ටමක පැවැති විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සමඟ 2015 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. 2015 වසරේ දී සමුච්චිත පදනම මත වෙළඳ හිඟය සුළු වශයෙන් වැඩි වූ අතර සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, 2015 වසරේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි සුළු පහළ යෑමක් වාර්තා විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීම සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ විදේශ විනිමය හුවමාරු ගිවිසුමකට එළඹීම මගින් ලද ලැබීම් 2015 වසරේ දී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් විය.

### අපනයන ක්‍රියාකාරිත්වය

2015 දෙසැම්බර් මාසයේදී අපනයන ආදායම අඛණ්ඩව දසවන මාසයටත් පහළ යෑමේ ප්‍රවණතාවයක් වාර්තා කරමින් එ.ජ.ඩොලර් මිලියන 817 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 18.7 කින් අඩු වූ අතර රෙදිපිළි හා ඇඟලුම් සහ තේ අපනයන ආදායම පහළ යෑම මේ සඳහා මූලික විය. යුරෝපය සහ ඇමරිකා එක්සත් ජනපදය යන වෙළඳපොළ වෙත කළ අපනයනයන්ගේ පහළ යෑම් පිළිබිඹු කරමින් මුළු අපනයනයන්ගෙන් සියයට 48 ක් පමණ වූ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම 2015 දෙසැම්බර් මාසයේ දී සියයට 12.8 කින් අඛණ්ඩව තුන්වැනි මාසයටත් අඩු විය. කෙසේ වුවද, මෙම මාසයේ දී කැනඩාව, චීනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි සාම්ප්‍රදායික

නොවන වෙළඳපොළවල් වෙත සිදු කළ ඇඟලුම් අපනයන ආදායම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.7 කින් සුළු වශයෙන් වර්ධනය විය. ප්‍රධාන තේ අපනයන ගමනාන්තයන්හි පවතින ආර්ථික හා භූ-දේශපාලනික වාතාවරණය හේතුවෙන් තේ අපනයන සඳහා 2015 වර්ෂය මුළුල්ලේම අඩු ඉල්ලුමක් පැවතිණි. මේ අනුව තේ අපනයන පරිමාව හා සාමාන්‍ය අපනයන මිල යන දෙකෙහිම පහළ යෑම් පිළිබිඹු කරමින් 2015 දෙසැම්බර් මාසයේ දී තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 24.7 කින් පහත වැටුණි. තවද, ප්‍රවාහන උපකරණ, රබර් නිෂ්පාදිත සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ යනාදියෙහි අපනයන ආදායම් අඩු වීම ද දෙසැම්බර් මාසයේ සමස්ත අපනයන ආදායම අඩු වීම කෙරෙහි සැලකිය යුතු ලෙස දායක විය. 2014 දෙසැම්බර් මාසයේ දී මගී නැවක් අපනයනය කිරීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ අපනයන ආදායම කැපී පෙනෙන ඉහළ යෑම මගින් ඇති වූ පදනම් බලපෑම ප්‍රවාහන උපකරණ අපනයන ආදායම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2015 දෙසැම්බර් මාසයේ දී රබර් නිෂ්පාදිත අපනයන ආදායම තවදුරටත් දුර්වල වූ අතර, එය පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 19.8 කින් පහත වැටුණි. කෙසේ වුවද, නැව් ඉන්ධන අපනයන පරිමාවන් සියයට 186.4 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වීම හේතුවෙන් ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 24.5 කින් වර්ධනය විය. මීට අමතරව, 2015 දෙසැම්බර් මාසයේ දී රසායනික නිෂ්පාදිත අපනයන ආදායම සියයට 10.5 කින් වර්ධනය වූ අතර කුරුඳු, වියන ලද රෙදි සහ පලතුරු යන උප කාණ්ඩයන්හි අපනයන ආදායම් ද 2014 වසරේ අනුරූප කාලයට සාපේක්ෂව වර්ධනය විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2014 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **752.1** | **624.1** | **(17.0)** | **8,262.0** | **7,975.6** | **(3.5)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 451.1 | 393.4 | (12.8) | 4,929.9 | 4,820.2 | (2.2) |
| එයින්, ඇඟලුම් | 432.1 | 369.2 | (14.5) | 4,682.3 | 4,555.6 | (2.7) |
| වියන ලද රෙදි | 6.5 | 9.6 | 47.2 | 90.3 | 101.5 | 12.4 |
| රබර් නිෂ්පාදිත | 72.9 | 58.5 | (19.8) | 889.8 | 761.2 | (14.5) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 29.5 | 18.1 | (38.6) | 393.6 | 331.7 | (15.7) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 30.9 | 23.4 | (24.2) | 342.9 | 293.8 | (14.3) |
| ප්‍රවාහන උපකරණ | 36.6 | 5.5 | (85.0) | 151.8 | 243.7 | 60.5 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 24.3 | 30.3 | 24.5 | 338.0 | 373.9 | 10.6 |
| රසායනික නිෂ්පාදිත | 9.8 | 10.8 | 10.5 | 134.4 | 126.4 | (5.9) |
| වෙනත් | 97.0 | 84.1 | (13.4) | 1,081.5 | 1,024.7 | (5.3) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **249.4** | **191.1** | **(23.4)** | **2,793.9** | **2,481.5** | **(11.2)** |
| තේ | 139.8 | 105.2 | (24.7) | 1,628.3 | 1,340.5 | (17.7) |
| පොල් | 26.5 | 23.7 | (10.6) | 356.4 | 351.7 | (1.3) |
| කුළුබඩු | 28.4 | 24.4 | (14.0) | 264.6 | 377.4 | 42.7 |
| එයින්, කුරුඳු | 13.7 | 14.2 | 3.8 | 139.8 | 139.6 | (0.2) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 21.1 | 14.4 | (31.8) | 165.2 | 160.4 | (2.9) |
| එයින්, පලතුරු | 3.5 | 4.1 | 17.7 | 44.2 | 38.0 | (14.0) |
| මුහුදු ආහාර | 21.8 | 15.0 | (31.2) | 252.7 | 163.1 | (35.5) |
| වෙනත් | 11.7 | 8.4 | (28.4) | 126.7 | 88.4 | (30.2) |
| **3. ඛනිජ වර්ග සහ වෙනත්** | **3.6** | **2.2** | **(37.9)** | **74.2** | **47.9** | **(35.4)** |
| **මුළු අපනයන** | **1,005.1** | **817.5** | **(18.7)** | **11,130.1** | **10,504.9** | **(5.6)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

## ආනයන ක්‍රියාකාරිත්වය

වසර අවසානය වන විට පැවති ආනයන වියදම ඉහළ යෑමේ සාමාන්‍ය නැඹුරුතාවයට වෙනස්ව යමින්, 2015 දෙසැම්බර් මාසයේ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,645 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 8.5 කින් අඛණ්ඩව හය වන මාසයටත් පහත වැටුණි. ආනයන වර්ධනයේ සිදු වූ මෙම පහත වැටීම සඳහා ඉන්ධන ආනයන වියදම අඩු වීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදමේ පහළ යෑම විශාල වශයෙන් දායක වූ අතර පරිභෝගික භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයන වියදම් පහත වැටීම ද මේ සඳහා දායක විය. 2015 දෙසැම්බර් මාසයේ දී ඉන්ධන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 216 ක් දක්වා සියයට 15.5 කින් පහත වැටුණු අතර, ආනයන මිල ගණන් සැලකිය යුතු පහළ යෑම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර තෙල් මිල ගණන් පහළ යෑමට සමගාමීව බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2014 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් 75.98 ට සාපේක්ෂව 2015 දෙසැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 41.21 ක් දක්වා පහත වැටුණි. පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2015 දෙසැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 384 ක් දක්වා සියයට 9.1 කින් පහත වැටුණි. පෞද්ගලික මෝටර් රථ සහ සහල් ආනයන වියදමේ වාර්තා වූ සැලකිය යුතු පහළ යෑම පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමේ පහළ යෑමට විශාල වශයෙන් දායක විය. දේශීය සහල් නිෂ්පාදනය ඉහළ යෑම හේතුවෙන් 2014 දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 50.0 ක් වූ සහල් ආනයන වියදම 2015 දෙසැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 1.7 ක් දක්වා අඛණ්ඩව අටවන මාසයටත් පහත වැටුණි. මෝටර් කාර් සහ මෝටර් සයිකල් ද ඇතුළු සියලු උප කාණ්ඩයන්හි වාර්තා වූ ආනයන පහළ යෑම් පිළිබිඹු කරමින් 2015 දෙසැම්බර් මාසයේ දී පෞද්ගලික මෝටර් රථ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 66 ක් දක්වා සියයට 41.1 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. ආයෝජන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති බස් රථ, ත්‍රී රෝද රථ සහ කෘෂිකාර්මික ට්‍රැක්ටර් වැනි ප්‍රවාහන උපකරණ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 49.8 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුවද, පිළිවෙළින් පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති එළවළු, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම් මෙම මාසය තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

## 2015 වසරේ විදේශ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය

වෙළෙඳ භාණ්ඩවල මිල ගණන් පහත වැටීම සහ ගෝලීය ඉල්ලුම පහත වැටීම පිළිබිඹු කරමින් 2015 වසරේ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 10,505 ක් දක්වා සියයට 5.6 කින් පහත වැටුණු අතර, ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 18,935 ක් දක්වා සියයට


2.5 කින් පහත වැටුණි. තේ, රබර් නිෂ්පාදිත, රෙදිපිළි හා ඇඟලුම් සහ මුහුදු ආහාර අපනයනයන්ගේ පහළ ක්‍රියාකාරිත්වය අපනයනයන්ගේ අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තාප විදුලිබල උත්පාදනයේ පහළ යෑම සහ තෙල් මිල ගණන් පහළ යෑම නිසා ඉන්ධන ආනයන වියදමෙහි වාර්තා වූ සැලකිය යුතු පහළ යෑම සමස්ත ආනයන වියදම පහත වැටීම සඳහා හේතු විය. 2015 වසර තුළ දී, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය තවදුරටත් ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා වූ ප්‍රධාන වෙළඳපොළවල් වූ අතර, එය මුළු අපනයනයෙන් සියයට 51 ක් පමණ විය. මේ අතර, ප්‍රධානම ආනයන ප්‍රභවයන් ලෙස තවදුරටත් ඉන්දියාව, චීනය, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ සිංගප්පූරුව පැවති අතර එය මුළු ආනයනයෙන් සියයට 60 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2014 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **422.1** | **383.8** | **(9.1)** | **3,852.5** | **4,713.5** | **22.3** |
| ආහාර හා පාන වර්ග | 169.3 | 149.5 | (11.7) | 1,633.7 | 1,627.8 | (0.4) |
| එළවළු | 29.5 | 48.0 | 62.9 | 283.9 | 396.4 | 39.6 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 51.5 | 3.1 | (93.9) | 297.5 | 151.6 | (49.0) |
| මුහුදු ආහාර | 14.5 | 27.1 | 87.4 | 144.1 | 221.1 | 53.4 |
| පාන වර්ග | 7.2 | 6.3 | (12.3) | 61.4 | 77.4 | 26.1 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 66.7 | 64.9 | (2.6) | 846.8 | 781.3 | (7.7) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 252.9 | 234.4 | (7.3) | 2,218.8 | 3,085.7 | 39.1 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 35.8 | 41.2 | 15.2 | 380.5 | 459.8 | 20.8 |
| රථවාහන | 111.5 | 65.7 | (41.1) | 896.7 | 1,359.6 | 51.6 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 105.6 | 127.5 | 20.7 | 941.6 | 1,266.2 | 34.5 |
| **2. අන්තර් භාණ්ඩ** | **936.9** | **855.4** | **(8.7)** | **11,397.7** | **9,638.2** | **(15.4)** |
| ඉන්ධන | 255.9 | 216.2 | (15.5) | 4,597.3 | 2,699.6 | (41.3) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 225.8 | 241.4 | 6.9 | 2,327.6 | 2,296.2 | (1.3) |
| රසායනික නිෂ්පාදිත | 84.7 | 72.4 | (14.5) | 808.2 | 870.3 | 7.7 |
| තිරිඟු හා ඉරිඟු | 47.7 | 35.0 | (26.8) | 404.7 | 357.2 | (11.7) |
| පොහොර | 24.2 | 28.0 | 15.6 | 272.4 | 289.6 | 6.3 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 23.0 | 26.1 | 13.3 | 190.7 | 278.6 | 46.1 |
| ඛනිජ නිෂ්පාදිත | 31.3 | 9.3 | (70.2) | 222.2 | 230.8 | 3.9 |
| සකස් නොකළ දුම්කොළ | 4.2 | 6.2 | 45.9 | 70.4 | 83.0 | 17.9 |
| වෙනත් | 240.0 | 220.9 | (8.0) | 2,504.1 | 2,532.8 | 1.1 |
| **3. ආයෝජන භාණ්ඩ** | **437.1** | **404.3** | **(7.5)** | **4,152.2** | **4,567.0** | **10.0** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 207.1 | 223.8 | 8.1 | 2,131.0 | 2,278.1 | 6.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 127.4 | 128.5 | 0.9 | 1,308.9 | 1,352.0 | 3.3 |
| ප්‍රවාහන උපකරණ | 101.4 | 50.9 | (49.8) | 707.3 | 930.9 | 31.6 |
| වෙනත් | 1.2 | 1.0 | (10.5) | 4.9 | 5.9 | 20.6 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.4** | **1.1** | **(20.3)** | **14.4** | **15.9** | **10.3** |
| **මුළු ආනයන** | **1,797.5** | **1,644.7** | **(8.5)** | **19,416.8** | **18,934.6** | **(2.5)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය**




**වෙළඳ ශේෂය**

2015 දෙසැම්බර් මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය 2014 දෙසැම්බර් මාසයේ තිබූ එ.ජ.ඩොලර් මිලියන 792 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 827ක් දක්වා වැඩි විය. සමුච්චිත වශයෙන් සැලකීමේ දී 2015 වර්ෂයේ දී වෙළඳ හිඟය එ.ජ. ඩොලර් මිලියන 8,430 ක් දක්වා සියයට 1.7 කින් සුළු වශයෙන් වැඩි විය.

**සංචාරක ඉපැයීම්**

සංචාරක පැමිණීම් වැඩි වීමේ ප්‍රවනතාවය අඛණ්ඩව පැවතෙමින් 2016 ජනවාරි මාසයේ දී සංචාරක පැමිණීම් පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 194,280 දක්වා සියයට 24.3 කින් වර්ධනය විය. මෙම මාසය තුළ දී ඉන්දියාව සහ චීනය වෙතින් වූ සංචාරක පැමිණීම් පිළිවෙළින් සියයට 25.9 ක සහ සියයට 122.3 ක ඉහළම වර්ධනයක් වාර්තා කිරීමත් සමඟ සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර දහයෙහි ප්‍රමුඛස්ථානයන් අඛණ්ඩව හිමිකර ගැනීමට සමත් විය. 2016 ජනවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 322 දක්වා සියයට 24.3 කින් වර්ධනය විය[1].

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2015 දෙසැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2014 දෙසැම්බර් මාසයේ වූ එ.ජ.ඩොලර් මිලියන 708.8 සිට එ.ජ.ඩොලර් මිලියන 618.5 දක්වා සියයට 12.7 කින් අඩු විය. 2014 දෙසැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්තාගත ලෙස ඉහළ වේගයකින් වැඩි වීම නිසා ඇති වූ පදනම් වර්ෂයේ බලපෑම වර්ධන

---

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

වේගයෙහි සිදු වූ සැලකිය යුතු අඩු වීම සඳහා හේතුවක් විය හැකිය. 2015 වසරේ දී සමුච්චිත පදනම මත විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2014 වසරේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 7,017.8 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 6,980.3 දක්වා සියයට 0.5 කින් සුළු වශයෙන් පහළ ගියේය. ජාත්‍යන්තර තෙල් මිල අඛණ්ඩව පහළ යෑම සහ මැදපෙරදිග රටවල මන්දගාමී වර්ධනය ද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල මෙම සුළු අඩු වීම සඳහා යම් පමණකට හේතු විය හැකිය.

**මූල්‍ය ලැබීම්**

2016 ජනවාරි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 29.5 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 118.3 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2016 ජනවාරි මස අග දක්වා කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ.ඩොලර් මිලියන 18.8 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර එය, ද්විතීයික වෙළඳපොළෙහි විදේශීය ආයෝජනයන්හි වූ එ.ජ.ඩොලර් මිලියන 19.0 ක ශුද්ධ ගෙවීම්වලින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 0.2 ක ලැබීම්වලින් සමන්විත විය. 2015 වසරේ දී රජය වෙත වූ දිගුකාලීන ණය 2014 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 645.7 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 463.1 ක ශුද්ධ ලැබීමක් විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2015 වසරේ දී සමස්ත ගෙවුම් තුලනය 2014 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 1,369 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,489 ක හිඟයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2015 දෙසැම්බර් මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ආනයනික මාස 4.6 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 7.3 ක් වූ අතර මුළු විදේශීය වත්කම් ආනයනික මාස 5.9 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 9.3 ක් විය.

2016 පෙබරවාරි මස අග වන විට ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 0.2 කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 6.8 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 2.3 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 3.3 කින් අධිප්‍රමාණය වූ අතර ජපන් යෙන්වලට එරෙහිව සියයට 6.1 කින් සහ යුරෝවලට එරෙහිව සියයට 0.3 කින් අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2014 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,005.1 | 817.5 | -18.7 | 11,130.1 | 10,504.9 | -5.6 |
| ආනයන | 1,797.5 | 1,644.7 | -8.5 | 19,416.8 | 18,934.6 | -2.5 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+) /හිඟය (-)) | -792.3 | -827.3 | 4.4 | -8,286.7 | -8,429.7 | 1.7 |
| සංචාරක ඉපැයීම් | 284.4(ආ) | 341.6(ආ) | 20.1 | 2,431.1 | 2,980.7 | 22.6 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 708.8 | 618.5 | -12.7 | 7,017.8 | 6,980.3 | -0.5 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 12.4 | -3.4 | -127.8 | 162.6 | 4.0 | -97.5 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 66.4 | 339.8 | 411.4 | 4,794.1 | 4,705.0 | -1.9 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 64.2 | 5.8 | -90.9 | 1,775.5 | 1,210.9 | -31.8 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 1,500.0 | 2,150.0 | 43.3 |
| දිගුකාලීන ණය | - | 320.5 | - | 1,438.7 | 1,267.8 | -11.9 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 1,069.4 (ආ) | 713.3 | -33.3 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විදේශ ආයෝජකයන් වෙත ආයෝජනය කිරීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස 09 සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.